**වසමේ නම සහ අංකය**

**784 කරපාගල**

**හැඳින්වීම :-**

784 කරපාගල වසම බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත්ව පිහිටා ඇත. මෙම කොට්ඨාශයේ උතුරින් පරෙයිගම දකුණ වසම ද දකුණින් 784 ඒ ගොරකදූව වසමද නැගෙනහිරින් රක්ෂිතය හා පැණියාවල දොළද බටහිරින් 783 ගම්මන නැගෙනහිර වසමින් ද මායිම් වන අතර මෙහි විශාලත්වය හෙක්ටයාර් 285 කින් යුක්ත භූමි භාගයක පිහිටා ඇත. වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වසම් 60න් එක් වසමකි, 784 කරපාගල ග්‍රාම නිළධාරී වසම.

රක්ෂිත වනාන්තරයකින් මායිම් වන මෙම වසම තෙක් බිම්වලින් ගහන වූ ස්වාභාවික සම්පත් හා විශාල ශ්‍රම බලකායකින් සමන්විත වන අතර යහපත් දේශගුණික තත්ත්වයන්ගෙන් යුක්තය. සමස්ථයක් වශයෙන් කඳු නිම්න හා තැනිතලාවන්ගෙන් සමන්විත වේ. මෙම වසම කුඩා ගම්මානවලින් සැදුම්ලත් ජනග්‍රහනය 967 දෙනෙක්ගෙන් සමන්විත කෘෂි කර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් බොදු ජනතාවක් පමණක් ජීවත්වීම මෙහි සුවිශේෂී ලක්ෂණයකි.

තෙක් කලාපයට අයත් මෙම ප්‍රදේශයට අවුරුද්දේ වැඩි මාස ප්‍රමාණයකට වර්ෂාපතනය ලැබේ. වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වසම් 60 අතරින් ඉතා දුෂ්කර පොදු පහසුකම් වලින් ඌන ග්‍රාම නිළධාරි වසමක් ලෙස 784 කරපාගල හැඳින්විය හැක.

**වසමේ නම සෑදුන ආකාරය :-**

අතීතයේ මේ ගම් ප්‍රදේශයේ ජීවත් වුන එක්තරා නුගත් මිනිසෙක් ගම් මායිමේ තිබෙන විශාල ගල් පර්වතයක් තමන්ගේ කරේ තබන්න පවසා කර පහත් කර ඇති බවත් එම නිසා කර පෑ ගල කරපාගල වු බව ගම්වාසීන්ගේ මතයයි.

**වසමට යන ගමන් මාර්ගය :-**

**කළුතර නගරයේ සිට :-**

කළුතර ගාලු පාරේ කටුකුරුන්ද හන්දියෙන් වම්පසට හැරී මතුගමට පැමිණ මතුගම අලුත්ගම මාර්ගයේ ලෙව්වන්දුව උපනගරයෙන් ඉත්තපාන අවිත්තාව මාර්ගයේ

ගලතරට පමිණ එතැන් සිට නෙළුව පාර දිගේ 2.5 km ක් යන විට කරපාගල වසමට පිවිසිය හැක.

**අළුත්ගම නගරයේ සිට :-**

අළුත්ගම මතුගම මාර්ගයේ ලෙව්වන්දුවට පැමිණ එතැනින් දකුණු පසට ඇති ඉත්තපාන අවිත්තාව මාර්ගයේ පැමිණ එතැන් සිට නෙළුව පාර දිගේ 2.5 km ක් යන විට කරපාගල වසමට පිවිසිය හැක.

**ඇල්පිටිය නගරයේ සිට :-**

ඇල්පිටිය පැලවත්ත මාර්ගයේ 2 km ක් පමණ පැමිණ එතනින් වම් පසට ඇති අවිත්තාව මාර්ගයේ අවිත්තාවට පැමිණ අලුත්ගම මාර්ගයේ උඩුගම හන්දියෙන් දකුණු දෙසට හැරී යන විට 784 කරපාගල වසමට පිවිසිය හැකිය.

**වර්ෂාපතනය :-**

මෙම වසම තෙත් කලාපයේ පිහිටීමත් සාගරයට ආසන්න බිමක් නිසා වර්ෂය පුරාම අධික වර්ෂාපතනයක් ලැබේ. වර්ෂාව ලැබෙන ප්‍රධාන කාල පරිච්ඡේදය නිරිත දිග මෝසම් ක්‍රියාත්මක වන කාල සීමාව වන අතර ඊසාන දිග මෝසම් සහ සංවහන ධරා ක්‍රියාත්මක වන කාලය තුළදි සැලකිය යුතු වර්ෂාපතනයක් දක්නට ලැබේ.

**වසමේ භූමියේ ස්වාභාවය:-**

මැටි හා තැනිතලා සහිත පසක් මේ ප්‍රදේශයේ දක්නට ලැබේ.

**පළාත් මට්ටමේ දක්ෂතා ඇති දරුවන්**

B.D පසිඳු නෙත්මික - මීටර් 100 ධාවන තරඟ/කඩුළු පැණිම

**වසමේ උසස් අධ්‍යාපන ලබන පුද්ගලයන්**

පියුමි නිසන්සලා විතානාරච්චි

රවිඳු ධනංජය විතානාරච්චි

P.K.මලිනි අප්සරා

W.G.ජීවනී ප්‍රශාදි වාසනා

W.G. නිරෝෂා කුමාරි